කෑගල්ල නගර සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 25 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් අතිරේක බිල් කිරීම රු. 525,419 ක් සමුච්චිත අරමුදල බැර කර තිබුණි. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ අවසාන ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට බාහිර පාර්ශවයන් 03 ක් විසින් නගර සභාවට එරෙහිව පවරා තිබූ නඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුවේ. | බාහිර පාර්ශවයන් විසින් නගර සභාවට එරෙහිව පවරන නඩු පිළිබඳ තොරතුරු මෙම වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරීමට කටයුතු කරමි. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 ක ශේෂයන් උපයෝගී ලේඛණ/වාර්තා අතර රු. 378,973 ක වෙනසක් විය. | ගිණුම් සැසඳීමට කටයුතු කර නිවැරදි කරගත යුතු වේ. | ගිණුම් ශේෂ සහ ලේඛණ ශේෂ සසඳා නිවැරදි කිරිමට කටයුතු කරමි. |

(ඈ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයක කාලයක් ඉක්මවූ ගෙවියයුතු කර්මාන්ත ණයහිමි ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 20,830,044 ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම කර්මාන්තයන් සදහා මේ වනවිට ගෙවීම් නිරවුල් කරමින් පවතී. |

1.4 අනුකූල නොවීම්

නීති ,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | නගර සභා ආඥාපනතේ 255 වන අධිකාරිය | | | | |
| | i 35 (ඊ) වගන්තිය | - | නගර සභාව සතු පොදු වැසිකිලි 3 ක් මහජන ප්‍රයෝජනය සඳහා විවෘත නොකර වසා දමා තිබුණු අතර, ඉන් එකක් වල් බිහි වී තිබුණි. | මහජන සුභසිද්ධිය සැලසීම පිණිස නගර සභා ආඥාපනත අනුව කටයුතු කළ යුතුවේ. | වැසිකිලි තුන සදහා කිසිදු ඉල්ලුම්කරුවෙකු ඉදිරිපත් නොවීම හා ඒ සඳහා යෙදවීමට ප්‍රමාණවත් සේවකයන් නොමැති වීමනිසා එම වැසිකිළි මහජන ප්‍රයෝජනය සඳහා විවෘත කිරීමට නොහැකි වී ඇත. |
| | ii 160 වගන්තිය | | නගර සභාවක් විසින් නගරය ඇතුලත පිහිටි යම් නිශ්චල දේපළක | නගර සභා ආඥාපනත අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී තක්සේරු ප්‍රතිශෝධන කටයුතු කිරීමට අවශ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | | හෝ යම් නිශ්චිත දේපළ වර්ගයක වාර්ෂික තක්සේරුව අනුව වරිපනම් බද්දක් පනවා අයකරනු ලැබියයුතු වුවත් 2009 වර්ෂයෙන් පසු වාර්ෂික තක්සේරුවක් කර නොතිබුණි. | | තොරතුරු සියල්ල සකස්කර මේ වනවිට තක්සේරු දෙපාර්ථමේන්තුව වෙත දන්වා යවා ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | - | | |
| (i) මුදල් රෙගුලාසි 571(2) | 2,764,366 | 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල තැන්පත් 137 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධව මේ වනවිට කටයුතු කරමින් පවතින අතර මින් වැඩි ප්‍රමාණයක් නිරවුල්කර ඇත. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | - | සභාවේ වාහන 22 ක හා යන්ත්‍ර 04 ක ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නියමිත දිනට ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1ඡේදය | | සභාව සතු වාහන 22 ක් හා යන්ත්‍ර 04 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ වනවිට ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකල යුතු සියලුම වාහන සඳහා එම පරීක්ෂනය සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| (ඈ) 2009 මාර්තු 09 දිනැති හා අංක 2009/01 දරන සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | - | | |
| 1.10 ඡේදය | | සභාවේ අනුමැතියකින් තොරව වෙළඳ සංකීර්ණ 07 ක | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ | විධිමත් අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. |

කඩකාමර 23 ක් යුතුවේ.
බදු දී තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 30,389,841 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,069,217 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් ,රැස් කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් ,රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 11,650,000 | 11,929,495 | 12,351,605 | 2,733,928 | 12,227,000 | 12,227,000 | 11,814,738 | 2,637,989 |
| බදු කුලී | 42,686,600 | 42,816,095 | 42,801,902 | 3,853,232 | 41,041,582 | 41,689,820 | 41,875,578 | 3,933,412 |
| බලපත්‍ර | 2,695,500 | 3,614,568 | 3,675,648 | 412,040 | 2,656,500 | 2,592,000 | 3,167,283 | 470,120 |
| වෙනත් ආදායම් | 116,737,953 | 116,273,133 | 123,618,300 | 27,583,558 | 128,394,498 | 128,555,498 | 104,868,665 | 35,474,508 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2018 ජනවාරි 01 දිනට ආදායම් ශීර්ෂ 04 ක හිඟ ආදායම රු. 6,837,134 ක් වූ අතර හිඟ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සියයට 8 සිට 32 දක්වා ඉතා අඩු මට්ටමක පැවතුණි. | ආදායම් රැස්කිරීමේ වර්ධනයක් ඇතිකර ගත යුතුවේ. | කඩ කාමර කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගන්නා අතර හිඟ සතිපොල ගාස්තු කපාහැරීමටත් ඉඩම් බදුකුලී ඉක්මණින් අයකර ගැනීමටත් හිග තානායම් කුලී ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතුව ඇති මුදල සම්බන්ධ ගැටලු නිරවුල් වූ පසු වෙනත් ආදායම් යටතේ වන හිග ආදායම් අයකිරීමේ ප්‍රගතිය වැඩිකර ගැනීමට ක්‍රියා කරමි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.2,733,928 ක් වූ අතර වර්ෂයක කාලයක් ඉක්ම වූ ශේෂය රු. 1,375,524 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | දේපල හිමිකරුවන් හඳුනා ගෙන හිඟ වරිපනම් බදු ශේෂය අවම මට්ටමකට ලඟාකර ගැනීම සඳහා කටයුතු කරමි. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදු කුලී ශේෂය රු.3,853,232 ක් වූ අතර වර්ෂයකට වැඩි කාලයක සිට අය නොවී පවතින ශේෂය රු. 3,122,626 ක් විය. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | (i) පදික කඩ කාමර තුනක් සඳහා නීතිමය ක්‍රියාමාර්ගයන් ගෙනඇති අතර ඉතිරි කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.<br><br>(ii) වැසිකිලි ගාස්තු සම්බන්ධව ඉක්මනින් විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමි.<br>(iii) නන්දිවෙල වත්ත හිගකුලී සම්බන්ධව ගැටලු සහගත තත්වයක් පවතී. කෙසේ වෙතත් නැවත ලේඛන පරීක්ෂාකර විසඳුමක් ලබාගැනීමට කටයුතු කරමි.<br><br>(iv) අයකර ගැනීමට නොහැකි වී ඇති සතිපොල කුලී රු.1,532,780 ක් කපා හැරීමේ නියෝග ලබා ගැනීම සඳහා ඉදිරිපත්කර ඇත.<br><br>(v) නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතුව ඇති හිඟ තානායම් කුලී රු. 502,026 ක් සම්බන්ධව ගැටලු සහගත තත්වයන් ඇති බැවින් එම ආයතනය සමග සාකච්ඡාකර සුදුසු තීරණයක් ගැනීමට කටයුතු කරමි. |

2.2.5 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ආදායම් හිඟ ශේෂය රු 27,583,559. ක් වූ අතර වර්ෂයකට වැඩි කාලයක් අය නොවී පවතින ශේෂය රු . 2,112,83ක් විය . | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | (i) ගෙවීම් පැහැර හරින ලද දැන්වීම් පුවරු හිමිකරුවන් සඳහා නීත්‍යානුකූලව කටයුතු කර මේ වනවිට රු.45,360 ක් උසාවියේ තැන්පත්කර ඇත. ඉතිරි හිඟ මුදල් ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවතී.<br><br>(ii) ඉඩම් බදුදීම් සම්බන්ධව ලිපි මගින් බදුකරුවන් දැනුවත්කර ඇත.<br><br>(iii) ලොතරැයි කුටි කුලී දඩ මේ වනවිට අයකරගෙන ඇත. |

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.167,615 ක් හා මුද්දර ගාස්තු රු.8,561,400 ක් විය. වර්ෂයකට වැඩි කාලයක් පවතින අයවියයුතු උසාවි දඩ රු. 117,615 ක් විය. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල් පළාත් සභාව හරහා ලැබෙන ආදායමකි. ඒ නිසා පළාත් පාලන කොමසාරිස් කාර්යාලය නිරවුල් කරදෙන ආකාරය අනුව මුදල් ලබා ගැනීම සිදුකරයි. |

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| නගරසභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 07 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 05 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවාගෙන ඒ අනුව කටයුතු කළ යුතුයි. | මෙතෙක් පනවා ගැනීමට කටයුතුකර නොමැති අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පනවා ගැනීමටත් දැනට පවත්නා අතුරු ව්‍යවස්ථා කාලානුරූපීව සංශෝධනය කිරීමටත් කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සකස් කළ යුතු ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී ඇත්දැයි පරීක්ෂා කළ නොහැකි විය . | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගති වාර්තා සැකසීමට කටයුතු කළ යුතුයි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සකස් කලයුතු ප්‍රගති වාර්තා ඉදිරියේදී නිසි පරිදි සකස් කිරීමට කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමවේදයක් නොතිබුණු බැවින් අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ බැවුම් ප්‍රදේශවලට නොදිරන ඝන අපද්‍රව්‍ය බැහැර කර තිබුණි . | නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුවේ. | සමස්ථ කසල බැහැර කිරීමේ ක්‍රියාවලිය නියමිත ක්‍රමවේදයට අනුව සිදුකරන අතර ප්‍රතිචක්‍රීකරණය කලහැකි සියලු කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරනු ලැබේ. එහෙත් අපිරිසිදු පොලිතින්, රබර් ,හම් වර්ග හා රෙදි වර්ග වැනි නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී කසල අංගනයේ ඉඩ ප්‍රමාණය ආදිය අනුව මෙය |

| | | |
|---|---|---|
| | | සිදුවී ඇති අතර ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |

(ඈ) අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මාර්ගයක වට රවුම සංවර්ධනය කිරීම සඳහා රු. 1,363,879 ක වටිනාකමකට 2017 ඔක්තෝබර් ටෙන්ඩර් ප්‍රදානය කර 2018 ජූනි 29 දින රු. 249,304 ක් ගෙවා තිබුණද, 2019 අප්‍රේල් 30 දින විටද මෙම කර්මාන්තය ආරම්භ කර නොතිබුණි. | කර්මාන්තය කඩිනමින් නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල සියලු ඉඩම් හිමියන් මේ වනවිට මෙම කර්මාන්තය සඳහා කැමැත්ත ප්‍රකාශකර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) නගර සභා බල ප්‍රදේශයේ පිහිටි ලොතරැයි අලෙවි කුටි 12 න් ආදායම් ලබා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | ලොතරැයි කුටි වලින් ආදායම් අයකර ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. | මේ වනවිට ලේඛන ගතව ඇති ලොතරැයි කුටිවලින් අදාල ගෙවීම් අයකරගෙන ඇත.එසේම නිශ්චිත ක්‍රමවේදයකට අනුව ඉදිරියේදී ගෙවීම් ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ)නීතිඥ කාර්යාල සංකීර්ණයේ එක් කාර්යාලයක් 2008 වර්ෂයේ සිට බදු ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයන්ට ලබා දීම නිසා රු. 105,342 ක හිඟ බදු කුළී අයකර ගැනීමට නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකිවී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | මෙම නීතිඥ කාර්යාල සංකීර්ණයේ අදාල කාර්යාල කොටසෙහි හිඟ බදු මුදල් නීත්‍යානුකූලව අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 70 ක් විධිමත් පරිදි කඩහිමියන් වෙත ලබාදී ආදායම් ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි. | කඩ කාමර ආදායම් අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතුවේ. | පදික කඩකරුවන් සඳහා ලබාදී ඇති කඩකාමර 70 ක් මෙසේ විධිමත් වී නොමැති අතර ඒ සම්බන්ධව ඉදිරියේදී සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. |
| (ඈ) පැරණි සති පොල කඩ 52 කින් අයවිය යුතු කඩ කුලී රු. 1,532,780 ක් කඩ හිමියන් සමඟ ගිවිසුම්ගත නොවීම හේතුවෙන් අයකර ගැනීම | නීත්‍යානුකූල ගිවිසුම් මඟින් කඩ කුලියට දීමට කටයුතු කළ යුතුවේ. | අයවිය යුතු මුදල කපාහැරීමේ නියෝගයක් ලබාගැනීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |

සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී තිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>අනුමත කාර්ය මණ්ඩලය 205 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 162 ක් වූ අතර , තනතුරු වර්ග 15 ක පුරප්පාඩු 43 ක් හා එක් තනතුරක් අතිරික්තව පැවතුණි. | සේවක පුරප්පාඩු හා අතිරික්ත තුලනය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලයෙහි පවතින පුරප්පාඩු සම්බන්ධව සෑම මසකට වරක්ම පළාත් පාලන සහකාර කොමසාරිස් හා ප්‍රධාන ලේකම් කාර්යාලයට වාර්තා කරන අතර අනුමත කාර්යය මණ්ඩලයට අමතරව සංවර්ධන නිළධාරී තනතුරක් අතිරික්තව පවතී. |
| (ආ) සේවක ණය<br>1997 වර්ෂයේ සිට ස්ථාන මාරු වී ගිය, සේවය හැරගිය, මිය ගිය, විශ්‍රාම ගිය නිලධාරින් හා සේවකයන් 20 දෙනෙකුගෙන් අයවියයුතු රු. 93,802 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය හිමියන්ට අදාල වගකිවයුතු අය හදුනාගෙන ණය මුදල් අයකර ගැනීමට කටයුතු සූදානම්කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු. 942,803 ක් වූ වාහන 04 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | දීර්ඝ කාලයක් නිශ්ක්‍රීයව පවතින වාහන අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම රථවාහන 2015 වර්ෂයේදී මිල ගණන් කැදවා ඉවත් කිරීමට කටයුතු කළද එහිදී තක්සේරු වටිනාකමට අදාල මිල ගණන් ඉදිරිපත් නොවූ හෙයින් එකී කාර්යය අවසන් කර ගැනීමට නොහැකි විය. එබැවින් නැවත වරක් තක්සේරු වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |

3.5 ප්‍රසම්පාදනය
--------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2018 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ඒ අනුව ප්‍රසම්පාදනයන් කළ යුතුවේ. | ඉදිරියේදී විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කරමි. |

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2018 වර්ෂයට අදාලව එම වර්ෂයේ දෙසැම්බර් මස 21 වන දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා ඇත. |